Department of Education,Sabaragamuwa Province/ Weekly School

**නිපුණතාවය :-** ව්‍යවසායකත්වය හා එහි වැදගත්කම අවබෝධ කොට ගෙන ව්‍යවසායකයකු වීමේ ඇල්ම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම :-** -ව්‍යවසායකත්ව සංකල්පය විග්‍රහ කරයි.

( පෙළ පොතේ පිටු අංක 01 සිට 06 දක්වා හොඳින් කියවා පහත ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න)

(01) ව්‍යවසායකත්වය යන්න නිර්වචනය කරන්න.

(02) එම නිර්වචනය තුළ ඇතුළත් පහත පද කෙටියෙන් පැහැදිලි කරන්න

- පරිසරයේ ඇති ව්‍යාපාර අවස්ථා
- අවදානම් දැරීම
- නිර්මාණශීලීත්වය
- නවෝත්පාදන

(03) 'ව්‍යවසායකත්වය' යන්න ව්‍යාපාරික දෘෂ්ටි කෝණයෙන් පැහැදිලි කරන්න.

(04)වඩාත් සුදුසු වචන යොදා හිස් තැන් පුරවන්න.

ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ යෙදී සිටින්නා ---------------- වේ. ඔහු අදහස් ක්‍රියාකාරිත්වයකට පරිවර්තනය කිරීම පිණිස ------------------- සහ ------------------- ආර්ථික හා සමාජයීය පරිවර්තනයක් සිදු කිරීම සඳහා සැලකිය යුතු වෙනසක් සිදුකරන්නා වූ පුද්ගලයෙකි.

(05) භාණ්ඩ හා සේවා නිපදවීම සඳහා විවිධ සම්පත් අවශ්‍ය වේ. සම්පත් ප්‍රධාන වශයෙන් වර්ගකර දැක්විය හැකි නිෂ්පාදන සාධක 04 දක්වන්න.

(06) නිෂ්පාදන සාධක හතර උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න.

(07) ශ්‍රමයේ ප්‍රභේද 02 දක්වන්න.

(08) නිෂ්පාදන සාධක අතර ව්‍යවසායකත්වයේ ඇති සුවිශේෂත්වය කුමක්ද ?

(09) පහත සඳහන් ඒවායින් ප්‍රාග්ධනය ලෙස සැලකිය නොහැක්කේ,

(i) ගොඩනැගිලි (ii) මුදල් (iii) වනාන්තර (iv) යන්ත්‍ර

**පෙළ පොතේ පිටු අංක 06 (ක්‍රියාකාරකම 02) සම්පූර්ණ කරන්න**